විදුර විද්‍යාලය - කොළඹ
4 වන ශ්‍රේණිය
සිංහල භාෂාව

- දුවේ පුතේ, පහත සඳහන් පිටපත් අලවා ඊට අදාල <u>අභ්‍යාසය</u> ඔබේ සිංහල ලිවීම පොතට පිටපත් කරන්න.

<u>ශිෂ්‍ය සටහන</u>

වාර්ෂික අධ්‍යාපන චාරිකා වාර්තාව

අප පාසලේ හතර වන ශ්‍රේණියේ ශිෂ්‍යශිෂ්‍යාවෝ එකසිය හතළිස් දෙනෙක් චාරිකාව සඳහා සහභාගි වූහ. අප පාසලෙන් පිටත් වූයේ පෙ.ව. 7.00ට ය. කෞතුකාගාරයට ළඟා වන විට පෙ.ව. 9.30 පමණ විය. කෞතුකාගාරයේ දී ශ්‍රී ලංකාවේ අවසාන රජු භාවිත කළ සිංහාසනය, රජුගේ ඔටුන්න හා කඩුව අපට දැකගත හැකි විය. පුරාණයේ සිට භාවිත කළ කාසි වර්ග, විවිධ කර්මාන්තවලට අදාළ උපකරණ හා මෙවලම් සුරක්ෂිත ව තැන්පත් කර තිබුණි. ප.ව.12.30 පමණ වන විට දහවල් ආහාරය ගත් අපි කෞතුකාගාරයේ සතුන්ගේ ඇට සැකිලි සුරක්ෂිත ව තබා ඇති ගොඩනැගිල්ල නැරඹුවෙමු. පුරාවිද්‍යා කැණීම්වල දී සොයා ගත් අතීත පුරාවස්තු තැන්පත් කර ඇති ආකාරය අපට දැක ගත හැකි විය. ප.ව. 2.00ට පමණ කෞතුකාගාරය නරඹා අවසන් විය. ආපසු අප පාසලට එන විට ප.ව. 4.00 පමණ විය

1. චාරිකාව ගියේ කොහේට ද ?
2. සහභාගි වූයේ කවුරුන් ද ?
3. චාරිකාව යාමට පාසලෙන් පිටත් වූයේ කීයට ද ?
4. එහි දී ඔබ දුටු දේ මොනවා ද ?
5. පාසලට එන විට වේලාව කීය ද ?